"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු"

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/IT-01/FI/16 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2024/12/04

**පාලන චක්‍රලේඛ 05 /2024**

ආණ්ඩුකාර ලේකම් (බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.)-(පළාත් පාලන/සෞඛ්‍යය/ප්‍රවාහන/අධ්‍යාපන/කෘෂිකර්ම),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් පුහුණු/ මුල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රධාන නීති නිලධාරී,
ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - බ.ප.

**බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල සහ පළාත් පාලන ආයතන සතු වෙබ් අඩවි අතුරින් හොඳම වෙබ් අඩවිය තේරීමේ තරඟාවලිය - 2024**

බස්නාහිර පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා වූ තොරතුරු හා දත්ත විධිමත් ව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගනිමින් තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීම දිරිගැන්වීමේ අරමුණින් බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල හා පළාත් පාලන ආයතනවල වෙබ් අඩවි පරීක්ෂා කර බලා යාවත්කාලීන කිරීම නිසි පරිදි සිදුකර පවත්වා ගෙන යනු ලබන ආයතනවල වෙබ් අඩවි තෝරා සම්මාන ප්‍රදානය කිරීමට තීරණය කර ඇත.

**02.** ඒ අනුව බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල හා පළාත් පාලන ආයතනවල වෙබ් අඩවි සියල්ලෙහි නිර්මාණශීලීත්වය, ග්‍රැෆික්ස් නිර්මාණයන් මගින් තොරතුරු ආකර්ෂණීයත්වය, ත්‍රෛභාෂා පහසුකම, තාක්ෂණික ගුණාංග හා අන්තර්ගත තොරතුරුවල යාවත්කාලීන භාවය සහ නිරවද්‍යතාව අනුව තෝරා ගැනීම සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය සුදුසුකම්, පාදක කර ගන්නා නිර්ණායක හා යෝජිත ලකුණු ලබා දීමේ ක්‍රමවේදය පහත දක්වා ඇත.

| | | නිර්ණායක | ලකුණු |
|---|---|---|---|
| **1** | **සම්පූර්ණ බව / ත්‍රෛභාෂා පහසුකම (12 ලකුණු)** | | **12** |
| | 1.1 | සියලු වෙබ් පිටුවල අන්තර්ගතය සම්පූර්ණ බව | 03 |
| | 1.2 | වෙබ් අඩවිය යාවත්කාලීන කර ඇති බව | 03 |
| | 1.3 | බිහිදොර පිටුවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි-යන කුමන හෝ භාෂා මාධ්‍යයක් තෝරා ගැනීමේ පහසුකම පැවතීම | 02 |
| | 1.4 | සියලු වෙබ් පිටු ත්‍රෛභාෂා පහසුකම සහිතව පැවතීම | 01 |
| | 1.5 | බාගත කිරීමේ පහසුකම (අයදුම්පත්, චක්‍රලේඛ ආදිය) භාෂා 03 සඳහා ම පැවතීම | 02 |

| | | | |
|---|---|---|---|
| | 1.6 | වෙබ් අඩවිය තුළ සෙවුම් කිරීමේ හැකියාවන්, සබඳතා තොරතුරු අන්තර්ගතය හා ප්‍රතිපෝෂණ පෝරම පැවතීම | 01 |
| **2** | **සංචලනය කිරීමට ඇති පහසුව (Navigation) (10 ලකුණු)** | | **10** |
| | 2.1 | සියලුම Links ක්‍රියාකාරී තත්වයේ පැවතීම (No broken links) හා අදාළ තොරතුරු සඳහා පහසුවෙන් පිවිසිය හැකි වීම | 05 |
| | 2.2 | ප්‍රධාන මෙනුව සහ උප මෙනු නිසි පරිදි පෙළගස්වා ඇති බව | 05 |
| **3** | **සම්මතයන්ට (Standard) අනුකූලව පැවතීම (08 ලකුණු)** | | **08** |
| | 3.1 | බහුලව පවතින වෙබ් බ්‍රවුසරයන් මත ක්‍රියා කිරීම (Browser Compatibility) | 03 |
| | 3.2 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) නිර්දේශිත රජයේ වෙබ් අඩවි සංවර්ධන ප්‍රමිතීන් (Government Web Development Standards) වලට අනුකූල බව | 02 |
| | 3.3 | පහසුවෙන් පිවිසිය හැකි බව (Availability) | 03 |
| **4** | **කාර්ය සාධනය (Performance) (10 ලකුණු)** | | **10** |
| | 4.1 | වෙබ් අඩවිය / පිටු සාපේක්ෂව අඩු කාලයකින් වෙබ් බ්‍රවුසරය මත දිස්වීම (Loading Time) | 04 |
| | 4.2 | වෙබ් අඩවියේ පිවිසුම් වාර ගණන (Visitor Count) | 02 |
| | 4.3 | අතුරු මුහුණත ඕනෑම උපාංගයකින් පහසුවෙන් නැරඹීමේ අනුකූලතාව හා smart ජංගම දුරකථන මත නිවැරදිව දිස්වීම | 04 |
| **5** | **වෙබ් අඩවි නිර්මාණය (10 ලකුණු)** | | **10** |
| | 5.1 | වෙබ් අඩවිය ක්‍රමවත් ව හා පැහැදිලි ලෙස සැලසුම් කර, නිර්මාණය කර ඇති බව (Clear Site Architecture) | 03 |
| | 5.2 | අඩවි සංචලන සැකැස්ම (Site Navigation Structure) සෑම වෙබ් පිටුවක් සඳහා ම පරිශීලකයාට පහසුවෙන් භාවිතා කළ හැකි වන පරිදි යොදා ගෙන ඇති බව | 03 |
| | 5.3 | පරිශීලක සුහදශීලීබව (User friendliness) | 02 |
| | 5.4 | සම්මත Headers, Footers, Menus, Colors, etc. භාවිතය | 02 |
| **6** | **පිටු සැකැස්ම (14 ලකුණු)** | | **14** |
| | 6.1 | ග්‍රැෆික් නිර්මාණ, වෙබ් අඩවි නිර්මාණය කිරීම සඳහා යොදා ගැනීම (Use of Chart, Graphics) | 04 |
| | 6.2 | සම්මත ප්‍රමාණයේ හා පහසුවෙන් කියවිය හැකි පරිදි Unicode Fonts වෙබ් අඩවිය සඳහා භාවිතා කර තිබීම හා තොරතුරු සුදුසු පරිදි වෙබ් පිටුවට සරිලන සේ පැහැදිලි ලෙස පෙළ ගන්වා ඇති බව | 03 |
| | 6.3 | සියලුම වෙබ් පිටු නිසි පරිදි නම් කර ඇති බව | 02 |
| | 6.4 | HTML Features වෙබ් අඩවිය සඳහා යොදා ගැනීම (Use of HTML Features) | 02 |
| | 6.5 | සම්මත නිර්මාණකරණ භාවිතාවන් (Color Scheme of Web Site) | 03 |
| **7** | **සංඛ්‍යාත්මක බව (Quantity) (06 ලකුණු)** | | **06** |
| | 7.1 | තොරතුරු අවබෝධ කිරීමට වැය වන කාලය අවම කර, එම තොරතුරු ඉක්මනින් ග්‍රහණය කිරීමට හැකි වන පරිදි දෘශ්‍ය තාක්ෂණික ශිල්පීය ක්‍රමෝපායන් (Visualization Techniques) භාවිතය | 03 |
| | 7.2 | වෙබ් අඩවිය මගින් බලාපොරොත්තු වන අරමුණු වලට අනුකූල බව | 03 |

| | | | |
|---|---|---|---|
| **8** | **ගුණාත්මක බව (Quality) (10 ලකුණු)** | | **10** |
| | 8.1 | අන්තර්ගත තොරතුරුවල නිරවද්‍යතාවය හා සම්පූර්ණ බව (Accuracy & Completeness of Content) | 02 |
| | 8.2 | නිර්මාණශීලී බව (Creativity) | 02 |
| | 8.3 | තොරතුරු ඉදිරිපත් කිරීමේ දී පහසුවෙන් හඳුනා ගත හැකි වන ලෙස සුදුසු පසුබිම් වර්ණයන්, borders හා නිදහස් අවකාශයන් භාවිතා කර පරිශීලකයන් වෙත ආකර්ශණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇති බව (Appealing to the intended audience) | 02 |
| | 8.4 | දීර්ඝ ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමේ දී Bullets, Numbers, Links, Tabs, Sub Menus භාවිතා කර එම තොරතුරු සංක්ෂිප්තව ඉදිරිපත් කර ඇති බව | 02 |
| | 8.5 | නියමිත භාෂා මාධ්‍යයන් භාවිතය, අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණයන්හි නිරවද්‍ය බව | 02 |
| **9** | **ආරක්ෂක ක්‍රමෝපායන් ක්‍රියාත්මක ව පවතින බව (Security) (05 ලකුණු)** | | **05** |
| | 9.1 | Security Features (User, Admin Level Password Protection) | 03 |
| | 9.2 | තොරතුරු ඉදිරිපත් කිරීමේදී දත්තවල සංවේදී බව පිළිබඳව සැලකිලිමත් වී ඇති බව | 01 |
| | 9.3 | යාවත්කාලීන මොඩියුල, නවීන තාක්ෂණයන් හා දත්ත ආරක්ෂණ ක්‍රමවේදයන් භාවිතය | 01 |
| **10** | **තොරතුරු දැන ගැනීමේ පනත (05 ලකුණු)** | | **05** |
| | 10.1 | තොරතුරු පනත පිළිබඳ විස්තර කිරීම | 01 |
| | 10.2 | තොරතුරු පෝරම | 01 |
| | 10.3 | තොරතුරු නිලධාරීන්ගේ විස්තර | 02 |
| | 10.4 | තොරතුරු පනතට අදාළ සුචි සහ ප්‍රගාමී තොරතුරු අඩංගු කිරීම | 01 |
| **11** | **SEO උපරිම කිරීම (05 ලකුණු)** | | **05** |
| | 11.1 | සෙවීම් එන්ජින් උපරිම කිරීමේ (SEO) ක්‍රමවේද අඩංගු කිරීම | 03 |
| | 11.2 | පින්තූර සඳහා Meta tags, alt texts, සහ යතුරු පද උපරිම කිරීම | 02 |
| **12** | **දත්ත විශ්ලේෂණ සහ වාර්තාකරණ (ලකුණු 15)** | | **15** |
| | 12.1 | පරිශීලක හැසිරීම් හඳුනා ගැනීම සඳහා දත්ත විශ්ලේෂණ මෙවලම් එක් කිරීම | 01 |
| | 12.2 | පරිපාලකයන්ට අඩවියේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට වාර්තා ලබා දීම | 02 |
| | 12.3 | වෙබ් අඩවියට නිවැරදි ලෙස upload කර ඇති චක්‍රලේඛ, නිවේදන, වාර්ෂික වාර්තා යාවත්කාලීන කිරීම | 03 |
| | 12.4 | සංවිධානමය ව්‍යුහය, පුවත්, අවසන් ගිණුම් විස්තර වැනි අංග නිසි ලෙස පවත්වා ගෙන යාම | 03 |
| | 12.5 | සියලුම අන්තර්ගතයන් කාලානුරූපව යාවත්කාලීන කර නවීන කර තිබීම | 02 |
| | 12.6 | වාර්තා, සටහන්, ප්‍රවෘත්ති, සහ සංවිධානමය ව්‍යුහය වැනි අංගයන් ව්‍යුහගත කර ඉදිරිපත් කිරීම | 02 |
| | 12.7 | ඉලක්ක සහ අරමුණු දක්වා වාර්තා, සංවර්ධන කාර්යයන් පැහැදිලිව ඉදිරිපත් කිරීම | 02 |
| **13** | **බහු භාෂා පරිශීලක උදව් (05 ලකුණු)** | | **05** |
| | 13.1 | සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා වල සජීව වැට හෝ chatbot සහාය ලබා දීම | 03 |
| | 13.2 | සියලුම භාෂාවල විස්තර සහිත පරිශීලක මාර්ගෝපදේශ හෝ පොදු ප්‍රශ්න (FAQs) ලබා දීම | 02 |
| **14** | **සමාජ මාධ්‍ය සම්බන්ධීකරණ සහ බෙදා ගැනීමේ විශේෂාංග (05 ලකුණු)** | | **05** |
| | 14.1 | සමාජ මාධ්‍ය වේදිකා සමඟ (Facebook, Twitter) නිරවුල් සම්බන්ධීකරණය | 03 |
| | 14.2 | අන්තර්ගතය සමාජ මාධ්‍ය ඔස්සේ පහසුවෙන් බෙදා ගැනීමේ විකල්ප | 02 |
| | | **මුළු ලකුණු** | **120** |

| | | | |
|---|---|---|---|
| **15** | **දඬ ලකුණු (ඍණ ලකුණු 10)** | | **-10** |
| | 15.1 | අවසරයකින් තොරව ප්‍රකාශන හිමිකම් සහිත තොරතුරු සහ පින්තූර භාවිතා කර තිබීම. (Copyright Laws) | -04 |
| | 15.2 | අවශ්‍ය නොවන අන්තර්ගතයන්, දැන්වීම්,හෝ මොඩියුල අඩවි වලට එක්කර වළකින ලීම.(Like ads, unwanted content) | -03 |
| | 15.3 | සෘජුව ගුගල් පරිවර්තන භාවිතා කර තිබීම (Google Translations) | -03 |

**03.** **ඉහත වගුවේ දක්වා ඇති නිර්ණායකවලට අමතරව මෙම තරගයට අදාළ වන පොදු කරුණු සහ මාර්ගෝපදේශන පහත පරිදි වේ.**

I. බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල සහ පළාත් පාලන ආයතන මගින් පවත්වා ගෙන යනු ලබන **"wp.gov.lk, wpc.gov.lk, mc.gov.lk, uc.gov.lk, sch.lk, zone.lk, edu.lk, ps.gov.lk"** යන ඩොමේන් නාම සහිත වෙබ් අඩවි මේ සඳහා සුදුසුකම් ලබයි.

II. ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් මගින් වෙබ් අඩවි ඇගයීම සිදු කරනු ලැබේ.

III. තරඟය සඳහා යම් වෙබ් අඩවියක් නියමිත නිර්ණායකයන්ට අනුකූලව නිර්මාණය කර ඇත්ද යන්න සහ එක් එක් නිර්ණායකයන් සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය ඒ සඳහා නිශ්චය කරගත් ක්‍රමවේදයකට අනුව තීරණය කිරීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතුවේ.

IV. තරඟය තුළ ජයග්‍රාහක වෙබ් අඩවි තෝරා ගැනීමේ දී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය ලෙස සැලකේ.

V. කිසියම් වෙබ් අඩවියක් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලෙස කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් විනිශ්චය මණ්ඩලය වෙත කුමන හෝ ආකාරයෙන් බලපෑම් සිදු කරන්නේ නම් අදාළ වෙබ් අඩවි තරඟය සඳහා නුසුදුසු බවට පත් කරනු ඇත. එවිට විනිශ්චය මණ්ඩලයේ තීරණය පරිදි එම වෙබ් අඩවි තරඟයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

VI. විනිසුරු මණ්ඩලයක් මගින් එක් එක් වෙබ් අඩවි විනිශ්චය කරනු ලබන අතර, යම්කිසි වෙබ් අඩවියක් වෙත ඒ සඳහා වෙන් කරනු ලබන ඇගයීම් කාලසීමාව තුළ කිසියම් හෝ තාක්ෂණික දෝෂයක් මත පිවිසීමට නොහැකි වුවහොත් එම වෙබ් අඩවිය ඇගයීම් කාර්යයෙන් ඉවත් කිරීමට සිදු වනු ඇත.

**04.** බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල සහ පළාත් පාලන ආයතන තරඟයට අනිවාර්යයෙන් ඇතුළත් වේ. මෙම සියලුම ආයතන ඇමුණුම 01 මගින් දක්වා ඇති ආකෘතියට අනුව, වෙබ් අඩවිය සහ ආයතනයේ සම්බන්ධීකරණ නිලධාරි පිළිබඳ මූලික තොරතුරු පහත සබැඳිය මගින් දක්වා ඇති Google පෝරමය සම්පූර්ණ කර 2024.12.16 දිනට පෙර ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

https://forms.gle/27CkCDvHcmDZux29A

**05.** මේ සම්බන්ධයෙන් ඔබ යටතේ ඇති සියලුම ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**06.** ආයතන කාණ්ඩ කිරීමක් නොමැති අතර පළාත් සභාවේ සියලුම ආයතනවල වෙබ් අඩවි අතරින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන තෝරා සම්මාන ලබා දීම සිදු කරනු ලැබේ. ඊට අමතරව උපරිම ලකුණු ලබාගන්නා ආයතන 15ක් සඳහා කුසලතා සහතික ප්‍රදානය කිරීම ද සිදු කරනු ලැබේ.

**07.** බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල හා පළාත් පාලන ආයතන සඳහා වෙබ් අඩවි නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාම දිරිගැන්වීම සඳහා පවත්වනු ලබන මෙම තරගයේ ඇගයීම් කටයුතු 2025 ජනවාරි මස 01 දින සිට 2025 ජනවාරි 31 දින දක්වා සිදු කිරීමට නියමිත බවත් කාරුණිකව දන්වමි.


එස්. එල්. ධම්මිකා කේ. විජයසිංහ,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත

දුරකථන අංකය - 0112092600
ෆැක්ස් අංකය - 0112092601
විද්‍යුත් ලිපිනය - chiefsecretary@wpc.gov.lk


<u>පිටපත්:</u>

1) සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
2) සියලුම ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන්,
3) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (කොළඹ/ගම්පහ/කළුතර),
4) සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
5) සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
6) ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම්,

} කා.දැ.ස. සහ අ.ක.ස.

ඇමුණුම - 01

# බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල සහ පළාත් පාලන ආයතන සතු වෙබ් අඩවි අතුරින් හොඳම වෙබ් අඩවිය තේරීමේ තරඟාවලිය - 2024 සඳහා ලියාපදිංචි වීම

1. බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාතර්මේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කායර්ාල සහ පළාත් පාලන ආයතන සතු වෙබ් අඩවි අතුරින් හොඳම වෙබ් අඩවි තේරීමේ තරභාවලියේ ඇගයීම් කටයුතු 2025 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.
2. මේ සඳහා සියලුම ආයතන 2024.12.16 දිනට පෙර මෙම පෝරමය සම්පූණර් කර අප වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

**udithabuddhi.itwpc@gmail.com** Switch account

* Indicates required question

**Email** *

☐ Record **udithabuddhi.itwpc@gmail.com** as the email to be included with my response

**Email** *

Your answer

*ආයතනය පිලිබඳ තොරතුරු :*

**01. ආයතනයේ නම ***

Your answer

**02. ආයතනයේ ලිපිනය ***

Your answer

**03. ආයතනයේ දුරකථන අංකය ***

Your answer

**04. ආයතනයේ වෙබ් ලිපිනය ***

Your answer

**05. ඔබ ආයතනය යටතේ උප කාර්යාල පවතින්නේද නැද්ද යන වග ***

- ඔව්
- නැත

**06. වෙබ් අඩවි පවත්වාගෙන යන උප කාර්යාල පවතින්නේ නම්, එම වෙබ් ලිපිනයන්**

Your answer

**07. ආයතන ප්‍රධානියාගේ නම** *

Your answer

**08. තනතුර** *

Your answer

**09. ඇමතුම් අංකය / දුරකථන අංකය** *

Your answer

**10. විද්‍යුත් තැපැල් ලිපිනය** *

Your answer

*වෙබ් අඩවිය භාරව සිටින නිලධාරියාගේ විස්තරය :*

**01. නම** *

Your answer

**02. තනතුර** *

Your answer

### 03. ඇමතුම් අංකය / දුරකථන අංකය *

Your answer

### 04. WhatsApp අංකය *

Your answer

### 05. විද්‍යුත් තැපැල් ලිපිනය *

Your answer

A copy of your responses will be emailed to udithabuddhi.itwpc@gmail.com.

Submit

Clear form

Never submit passwords through Google Forms.

This content is neither created nor endorsed by Google. - Terms of Service - Privacy Policy

Does this form look suspicious? Report

Google Forms